ගාල්ල මහා නගර සභාව - 2021

-----------------------------------

**1.** **මූල්‍ය ප්‍රකාශන**

-----------------

**1.1** **අහිතකර මතය**

----------------

ගාල්ල මහා නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට ගාල්ල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **අහිතකර මතය සඳහා පදනම**

---------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා, මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අහිතකර මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අහිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4** **විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

-----------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ

අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මහා නගර සභාවට පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු එකතුව රු.1,855,456 ක් වත්කම් අඩුවෙන් දක්වා තිබුණි.<br><br>(ii) 2021 වර්ෂයේ දී සභාව මිල දී ගෙන තිබුණු වායු සමීකරණ යන්ත්‍ර 3 ක වටිනාකම රු.457,470 ක් වියදම් ලෙස කපාහැර තිබුණි.<br><br>(iii) 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා උසාවි දඩ ඌන වෙන්කිරීම් රු.42,656,469 ක් හා 2020 වර්ෂයේ අධි වෙන්කිරීම් රු.16,583,912 ක් ගිණුම්වලට නොගැලපීම නිසා සමුච්ත අරමුදල රු.26,072,557 කින් අඩුවෙන් දක්වා තිබුණි.<br><br>(iv) 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා මුද්දර ගාස්තු අධි වෙන්කිරීම් රු.232,252,745 ක් ගිණුම්ගත නොකිරීම නිසා සමුච්චිත අරමුදල වැඩියෙන් දක්වා තිබුණි.<br><br>(v) රු.4,584,070 ක් වටිනා වාහන 18 ක් සහ පිරිවැය හඳුනාගත නොහැකි වාහන 19 ක් වෙන්දේසි කර ඉවත් කර තිබුණු නමුත්, ඒවා ස්ථාවර වත්කම් ගිණුම් වලින් ඉවත් කිරීමට හා ලද ලාභය හෝ අලාභය ගණනය කර ගිණුම්වලට ගෙන නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම් ගතකළ යුතු වේ. |

| | | |
|---|---|---|
| (vi) 2021 දෙසැම්බර් 31 දිනට නාගරික ඉංජිනේරු (යාන්ත්‍රික) දෙපාර්තමේන්තුවේ පැවති ශේෂයන් උපුටා ගැනීමේදී, ණයහිමි වියදම් රු.25,051,747 ක් වැඩියෙන් සටහන් කිරීම නිසා ප්‍රවර්තන වර්ෂයේ අතිරික්තය සමාන වටිනාකමින් අඩුවෙන්ද, වර්ෂ අවසාන ණයහිමි ශේෂය සමාන වටිනාකමින් වැඩියෙන් ද දක්වා තිබුණි.<br><br>(vii) සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විට අවලංගු කර තිබු ව්‍යාපෘති 08 ක එකතු වටිනාකම රු.4,323,235 ක් ප්‍රවර්තන වර්ෂයේ වියදම් හා ණය හිමියන් සේ සලකා ගිණුම්ගත කිරීම නිසා ප්‍රවර්තන වර්ෂයේ වියදම් හා ණය හිමියන් සමාන වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.<br><br>(viii) සමාලෝචිත වර්ෂය අවසාන දින වන විට ගෙවීම් කර නොතිබු එකතුව රු.4,162,152 ක් වු ව්‍යාපෘතින් 5 ක් සම්බන්ධයෙන් ණයහිමි හා වියදම් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම් ගතකළ යුතු වේ. |

### 1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 12 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.29,115,991 ක වෙනසක් නිරීක්ෂණය විය. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | අසමානතාවයන් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. |

### 1.6.3 අවිනිශ්චිත ගිණුම

| | | |
|---|---|---|
| (අ) 2003 වර්ෂයේ සිට පැවත එන රු.111,553 ක් වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය සමාලෝචිත වර්ෂය අවසන්වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.<br><br>(ආ) 2006 වසරේ සිට දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශනවල පැවත එන ගිණුම් 03 ක හර එකතුව රු.42,103,545 ක් හා ගිණුමක බැර ශේෂය රු.43,062,414 ක් නිශ්චිතව හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ශේෂය කපාහැරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමි. | ශේෂය පිළිබඳ සොයා බලා නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.1,283,571,137 ක් වූ ගිණුම් විෂයයන් 09 ක් සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | මූලා ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. |

### 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| **පාර්ලිමේන්තු පනත්** | | | |
| 1947 අංක 16 දරන මහා නගර සභා ආඥා පනත 225 වගන්තිය | ගිණුම් විගණකවරයන්ගේ සේවය සඳහා සාධාරණ යැයි මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් සහතික කරනු ලබන මුදල් ප්‍රමාණ, මහා නගර සභා අරමුදලින් කලින් කල භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාට ගෙවිය යුතු වුවත්, 2016 වර්ෂයේ සිට එසේ කටයුතු කර නොතිබුණි. | මුදල් කමිටු හා මහා සභාවේ අනුමැතිය ලබා දී නොමැති බව ප්‍රකාශ කරමි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

### 1.7.2 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (i) ගාල්ල තැපැල් කාර්යාලය ඉදිරිපිට දෙමහල් සාප්පු සංකීර්ණය වසර 20 කට අධික කාලයක් තිස්සේ ටෙන්ඩර්කරුවෙකු වෙත ලබා දී තිබුණ ද ගිවිසුම් ප්‍රකාරව එහි බදු මුදල වසර 5 කට වරක් සංශෝධනය කර නොතිබුණි. 2021 වර්ෂය වන විට හිඟ බදු හා දඩ මුදල් එකතුව රු.10,076,018 ක් වූ අතර, බදුකරු වෙත සාප්පු සංකීර්ණය පවත්වාගෙන යාමට ඉඩ සලසා තිබුණි. | නඩු පවරා ඇති බැවින් නඩු තීන්දුව අනුව කටයුතු කරමි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ii) හිල්ටොප් නිවාඩු නිකේතනයට අදාළ වන්දි මුදල් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, රු.759,190 ක බදු මුදල් ද අයකර ගැනීමට හෝ නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.253,560,459 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.154,028,966 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අගරු චෙක්පත් වටිනාකම රු.309,416 ක් වූ අතර, ඉන් රු.253,942 ක් වටිනා චෙක්පත් 15 ක් අගරු වී වසර 3 - 24 ත් අතර කාලයක් ගත වී ඇත. රු.55,474 ක් වටිනා ඉතිරි අගරු චෙක්පත් වටිනාකම සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් නොතිබූ අතර, මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | කපාහැරීම සඳහා කටයුතු කරමි. | අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. |
| (ආ) නගර සභා ආඥා පනතේ 183(1) වගන්තිය ප්‍රකාරව පිහිටුවන ලද සේවක අර්ථසාධක සාමාජික අරමුදල් ගිණුමේ 2021 දෙසැම්බර් 31 දින වන විට රු.13,744,366 ක් පැවති අතර, ඒවායේ හිමිකාරිත්වය පිළිබඳ නිශ්චිත තොරතුරු නොමැති බැවින් සභාවේ ආදායමට හෝ ආපසු ගෙවීම පිළිබඳව අවධානය යොමු කර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය. | මේ සඳහා කිසිදු ලේඛනයක් නොමැති බව දන්වමි. | මෙම මුදල් වල අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කළයුතු වේ. |

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **බලපත්‍ර ගාස්තු** | | |
| වාර්ෂිකව ලබාගත යුතු බලපත්‍ර සඳහා හිඟ බලපත්‍ර ගාස්තුවක් පැවතිය නොහැකි නමුත්, සමාලෝචිත වර්ෂය අවසානයට රු. 5,590,271 ක හිඟ බලපත්‍ර ගාස්තුවක් පැවතුණ අතර, මහා නගර සභා ආඥා පනතේ 247අ(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කරමි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) මහා නගර සභා සභිකයින්ට ජංගම දුරකථන ලබා දීම** | | |
| (i) නගරාධිපතිට හා නියෝජ්‍ය නගරාධිපතිට 2014.07.22 දින ජංගම දුරකථන ලබා දී තිබුණ ද, 2020 වර්ෂයේ දී නැවතත් රු.99,000 ක් වටිනා ජංගම දුරකථන 02 ක් ලබා දීමට කටයුතු කර තිබුණි.<br><br>(ii) සභා අරමුදලෙන් රු.1,460,300 ක් වැයකර, 2012 මාර්තු ලැප්ටොප් 17 ක් හා රු.791,982 ක් වැයකර 2014 ඔක්තෝබර් ටැබ් 18 ක් සභිකයින්ට බෙදා දී තිබුණ ද, සභිකයින් 11 දෙනෙකු ලැප්ටොප් හා සභිකයින් 09 දෙනෙකු ටැබ් නැවත භාර දීමට කටයුතු කර නොතිබුණි. | නැවත භාර දෙන ලෙස සභිකයින්ට දැනුම් දී ඇත. | භාර දීම හා නැවත භාර ගැනීම විධිමත්ව සිදුකළ යුතු වේ. |
| (ආ) සභාවට අයවිය යුතු වෙළඳ බලපත්‍ර ගාස්තු හා කර්මාන්ත බදු පැහැර හැරීම සම්බන්ධයෙන් 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා නඩු 2107 ක් උසාවියේ ගොනු කර තිබු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම නඩු වලින් රු.9,073,813 ක් සභාවට අය වීමට තිබුණි. ඒ අනුව 2018 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂය වන විට එම බදු පැහැර හැරීම සියයට 167 කින් වර්ධනය වී තිබු නමුත්, මෙලෙස නගර සභා ආඥා පනත ප්‍රකාරව සභාවට ගෙවිය යුතු ගාස්තු දිගින් දිගටම පැහැර හැරීම් වැඩි වීම පිළිබඳව සභාවේ අවධානය යොමු වී නොතිබුණි. | හිඟ ගාස්තු අයකර ගැනීම සඳහා නඩු පැවරීමට කටයුතු කලෙමි. | අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. |

## 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව පොදු ගබඩාවෙහි භාණ්ඩ වර්ග 587 කට අයත් එකතුව රු.16,196,161 ක් වටිනා භාණ්ඩ 21,658 ක ඌනතාවයක් පැවති අතර, මහජන පුස්තකාල 3 ක රු.151,425 ක් වටිනා පුස්තකාල පොත් 553 ක ඌනතාවයක් නිරීක්ෂණය විය. | මේ සම්බන්ධයෙන් ඉදිරියේ දී කටයුතු කරමි. | ඌණතාවයන් සම්බන්ධයෙන් විධිමත්ව කටයුතු කළ යුතු වේ. |

## 3.3 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාව විසින් 2021 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී එකතුව රු.2,003,599,223 ක් වටිනා ගනුදෙනු සටහන් කිරීම සඳහා ජර්නල් සටහන් 48 යොදා ගෙන තිබුණද, ඒවා පරීක්ෂා කර සහතික කිරීමෙන් අනතුරුව අනුමැතිය ලබා දිය යුතු නමුත්, එලෙස අභ්‍යන්තර පරික්ෂාවක් සිදු කර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිසි අනුමැතිය ලබාගත යුතුයි |

## 3.4 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කෝන්ගහ ගව මස් වෙළඳසැල 2021 වර්ෂය සඳහා ටෙන්ඩර් කිරීමේදී ඒ සඳහා ටෙන්ඩර් මණ්ඩලය හා මුදල් කාරක සභාව විසින් තීරණය කළ පරිදි තෝරාගත් වැඩිම මිල ඉදිරිපත් කර ලංසු කරු වෙත ටෙන්ඩරය ලබා නොදී පැරණි කොන්ත්‍රාත්කරුටම ලබා දීමට සභාව විසින් තීරණය කිරීම නිසා සභාවට රු.2,058,258 ක පාඩුවක් සිදු කර තිබූ අතර, ඒ සම්බන්ධයෙන් සභාවේ අවධානය යොමු කර නොතිබූ බව නිරීක්ෂණය විය. | මාසික බදු මුදල මත පවත්වාගෙන යාමට තීරණය කළෙමි. | ටෙන්ඩර් පරිපාටි මත බදු දීම සිදුකළ යුතු වේ. |